මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/08** **2024.10.04**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

### ජනාධිපතිවරණයේ දී අත්හිටුවා තිබූ කාර්යයන් සඳහා අනුමැතිය ලබාදීම.

පසුගිය ජනාධිපතිවරණ කාල සීමාවේ දී දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන අයුරින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ යම් යම් වැඩසටහන්/ ව්‍යාපෘති සහ ජනතා සහන ලබාදීම් මැතිවරණ කොමිෂන් සභාව විසින් අත්හිටුවීමට කටයුතු කළ ද මේ වන විට ජනාධිපතිවරණ කාල සීමාව අවසන්ව ඇති හෙයින්, එකී වැඩසටහන්/ ව්‍යාපෘති හා ජනතා සහන ලබාදීම් වැනි කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා නැවත මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නොවේ.

විශේෂයෙන්ම 2024/ 2025 මහ කන්නයේ වගා කටයුතු සඳහා පොහොර ලබාදීම, ධීවරයන් සඳහා වූ සහනාධාර මෙන්ම සැප්තැම්බර් මාසයේ හිඟ මුදල ද සමඟ ඔක්තෝබර් මාසයට ගෙවීමට නියමිත විශ්‍රාමික වැටුප් සඳහා වැඩි කළ දීමනාව සහ රටේ සාමාන්‍ය පරිපාලනය හා රාජ්‍ය සේවය කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාම වෙනුවෙන් ජනාධිපතිවරණ කාලසීමාවේ දී තාවකාලිකව අත්හිටුවා තිබූ සියලු කාර්යයන් නැවත ක්‍රියාත්මක කිරීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ විරුද්ධත්වයක් නොමැත.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරණයේ දී අත්හිටුවා තිබූ උක්ත කාර්යයන් ජනාධිපතිවරණය අවසන් වීමත් සමඟ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇති බැවින් යම් යම් පුද්ගලයන් හා පාර්ශ්ව විසින් මහජනතාව නොමග යවන අන්දමේ ප්‍රකාශ හා මත සමාජ මාධ්‍ය වේදිකා හා වෙනත් මාධ්‍ය හරහා ප්‍රචාරය කරනු ලබන බව නිරීක්ෂණය වන අතර එවැනි පදනම් විරහිත ප්‍රකාශ කරනු ලැබුවහොත් ඒවා නොසලකා හරින මෙන් හා මැතිවරණ කොමිෂන් සභාවේ තීරණ කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කරන මෙන් මැතිවරණ කොමිෂන් සභාව මහජනතාවගෙන් ඉල්ලා සිටී.

එසේ වුව ද එළඹෙන මහ මැතිවරණ කාලසීමාව තුළ සිදු කරනු ලබන ඉහත ආකාරයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම සඳහා අදාළ ආයතන විසින් මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.ඒ.එල් රත්නායක
සභාපති,මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.